## ප්‍රත්‍යාස්ථතාවය සම්බන්ධ ගැටලු විසඳීමේ මූලධර්ම

**ආතතිය දන්නා විට විතතියත්, විතතිය දන්නා විට ආතතියත් සෙවීම.**

ප්‍රත්‍යාස්ථ වස්තුවක් සඳහා ප්‍රත්‍යාස්ථ සීමාව දක්වා $\frac{F}{A} = y\frac{e}{l}$ බැවින්, ආතතිය දන්නා විට විතතිය සෙවීමට $e = \frac{FL}{Ay}$ ද, විතතිය දන්නා විට ආතතිය සෙවීමට $F = \frac{yAe}{l}$ භාවිත කරනු ලැබේ.

1. $L$ දිගැති දණ්ඩක් තනා ඇත්තේ යංමාපාංකය $Y$ වන ලෝහයකිනි. දණ්ඩ $F_1$ බලයකින් අදිනු ලබන විට එහි දිගෙහි වැඩි වීම $e_1$ වන අතර දණ්ඩ $F_2$ බලයකින් තෙරපනු ලැබූ විට එය $e_2$ ප්‍රමාණයකින් කෙටි වේ. දණ්ඩේ හරස්කඩ වර්ගඵලය $A$ ද සහ බල දෙක ප්‍රත්‍යාස්ථ සීමාවේ පවතින්නේ යයිද සැලකූ විට පහත සඳහන් කුමන සමීකරණය සාවද්‍ය වේද?

   (1) $LF_1 = Aye_1$  (2) $\frac{F_2}{A} = y\frac{e_2}{l}$  (3) $\frac{F_1}{F_2} = \frac{e_1}{e_2}$  4) $LF_2 = Aye_1$  (5) $\frac{F_1}{e_1} = \frac{AY}{L}$

2. එකම ද්‍රව්‍යයකින් සෑදි කම්බි දෙකක දිග අතර අනුපාතය 1:2 වන අතර අරයන් අතර අනුපාතය 1:√2 කි. ඒවා එකම අගයක් යොදා අදිනු ලබයි නම් දිගෙහි වැඩි වීම අතර අනුපාතය වනුයේ,

   (1) 1:1  (2) 1:2  (3) 2:1  (4) 2:√2  (5) √2:2

3. එකම ද්‍රව්‍යයකින් සෑදි එකම දිගින් යුත් කම්බි දෙකක විෂ්කම්භයන් අතර අනුපාතය 1:2 කිග ඒවාට පිළිවෙලින් $F_1$ හා $F_2$ බල යෙදූ විට විතතීන් සමාන වේග $\frac{F_1}{F_2}$ අනුපාතය වනුයේ,

   (1) 2  (2) 1/2  (3) 4  (4) 1/4  (5)5

4. ඉහළ කෙලවර අචල ලෙස සවි කර ඇති කම්බියකින් පරිමාව $4 \times 10^{-4}\ m^3$ වූ වස්තුවක් එල්වා ඇතග කම්බියේ අරය 0.2mm වන අතර එය යංමාපාංකය $7 \times 10^{11}\ Nm^{-2}$ වූ ද්‍රව්‍යයකින් සාදා ඇත. වස්තුව සම්පූර්ණයෙන්ම ජලයේ ගිල්වූ විට කම්බියේ දිග $10^{-3}$m ප්‍රමාණයකින් වෙනස් වේ. වස්තුව වාතයේ එල්වා ඇති විට කම්බියේ දිග සොයන්න. ( ජලයේ ඝනත්වය = $10^3\ Kgm^{-3}$)

   (1) 10 m  (2) 22m  (3) 2.5 m  (4)31 m  (5) 3.5 m

**ශ්‍රේණිගත දඬුවල ගණනය කිරීම.**

දඬු දෙකක් හෝ වැඩි ගණනක් ශ්‍රේණිගතව තබා බලයක් යෙදූවිට එක් දණ්ඩක ඇතිවන ආතතීන් සමාන වේ. එක් එක් දණ්ඩේ විතතීන්ගේ එකතුව මුළු විතතියට සමාන වේ.එක් එක් දන්ඩේ විතතිය $e_1$ සහ $e_2$ ද මුලු විතතිය $e$ ද නම්

$e_1 + e_2 = e$

ඉන්පසු $e = \frac{FL}{Ay}$ මගින් $e$ වල ප්‍රකාශන සොයා ආදේශ කරනු ලැබේ.




5. දිග $1.5m$ සහ විෂ්කම්භය $2mm$ බැගින් වූ තඹ සහ වානේ කම්බි දෙකක් එක් අග්‍රයකින් සම්බන්ධ කර ඇත්තේ දිග $3m$ වන තනි කම්බියක් සෑදෙන පරිදිය. සංයුක්ත කම්බියට භාරයක් යෙදීමෙන් එහි ඇති වන මුළු විතතිය $3mm$ වේ. එක් එක් කම්බියේ විතතියද යොදන ලද භාරයද ගණනය කරන්න.

   තඹ වල යංමාපාංකය  $1.2 \times 10^{11}\ Nm^{-2}$
   
   වානේ වල යංමාපාංකය  $2.0 \times 10^{11} Nm^{-2}$

6. සමාන දිග සහ සමාන ක්ෂේත්‍රඵල ඇති $A$ සහ $B$ කම්බි දෙකක් රූපයේ ආකාරයට සම්බන්ධ කර ඇත $A$ හා $B$ හි යංමාපාංක පිළිවෙලින් $E_A$ හා $E_B$ වේ. $B$ හි නිදහස් කෙලවරින් $M$ ස්කන්ධයක් එල්වා ඇත

   $\frac{\text{A හි විතතිය}}{\text{B හි විතතිය}}$ යන අනුපාතය,

   (1) $E_A/ E_B$  (2) $E_B/ E_A$  (3) $(E_B/ E_A)^2$  (4) $(E_A/ E_B)^2$  (5) 1



## සමාන්තරගත දඬුවල ගණනය කිරීම.

දණ්ඩු දෙකක් හෝ වැඩි ගණනක් සමාන්තරගතව සවිකර බලයක් යෙදූ විට ඇතිවන විතතීන් සමාන වේ. ආතතීන්ගේ එකතුව මුළු ආතතියට සමාන වේ. සංයුක්ත දන්ඩට $F$ බලයක් යෙදු විට එක් එක් දන්ඩට ඇතිවන ආතතීන් $F_1$ සහ .$F_2$ ද නම් $F = F_1 + F_2$

ඉන්පසු $F = \frac{yAe}{l}$ භාවිතයෙන් $F$ වල ප්‍රකාශන සොයා ආදේශ කරනු ලැබේ.




7. දිග $1m$ සහ විෂ්කම්භය $2mm$ වන සිරස් තඹ කම්බියකට ආසන්නව සහ සමාන්තරව සෑම අතින්ම සමාන වානේ කම්බියක් තබා ඒවායේ පහළ කෙළවර දෙක සම්බන්ධ කර ඇත. තවද දිග $1m$ වනසේ ඉහළ කෙළවරද සවිකර ඇත. මෙම සංයුක්ත කම්බියේ පහළ සම්බන්ධිත කෙළවරින් $20N$ භාරයක් එල්ලා ඇත. මේ සංයුක්ත කම්බියේ විතතිය ගණනය කරන්න.

තඹ වල යංමාපාංකය $1.2 \times 10^{11}$ Nm$^{-2}$ වානේ වල යංමාපාංකය $2.0 \times 10^{11}$Nm$^{-2}$

8. හරස්කඩ ක්ෂේත්‍රඵලය $A$ ද යංමාපාංකය $Y_1$ ද හා ස්වභාවික දිග $L_1$ බැගින්ද වන සිරස් කම්බි දෙකක් ආධාරයෙන් බර $W$ වන ඒකාකාර දණ්ඩක් තිරස් සීලිමක එල්ලා ඇතග කම්බි සම්බන්ධ කර ඇත්තේ දණ්ඩේ කෙලවරටයිග හරස්කඩ ක්ෂේත්‍රඵලය $A$ ද යංමාපාංකය $Y_2$ හා ස්වභාවික දිග $L_2$ වන තවත් කම්බියක් ආධාරයෙන් 2උ බරක් දණ්ඩේ කේන්ද්‍රයෙහි දැන් එල්ලනු ලැබේග පද්ධතියේ මුළු විතතිය දෙනු ලබන්නේ

(1) $\frac{W}{A}\left[\frac{L_1}{2Y_1} + \frac{L_2}{Y_2}\right]$ (2) $\frac{W}{A}\left[\frac{L_1}{Y_1} + \frac{L_2}{Y_2}\right]$ (3) $\frac{W}{A}\left[\frac{3L_1}{Y_1} + \frac{2L_2}{Y_2}\right]$ (4) $\frac{W}{A}\left[\frac{3L_1}{Y_1} + \frac{L_2}{Y_2}\right]$ (5) $\frac{W}{A}\left[\frac{3L_1}{2Y_1} + \frac{2L_2}{Y_2}\right]$

## වික්‍රියා ශක්තිය සම්බන්ධ ගැටළු විසඳීම.

ප්‍රත්‍යස්ථ වස්තුවකට බලයක් යොදා ආතතියක් ඇතිකර විතතියක් ඇතිකළ විට යම් ශක්තියක් ගබඩා වේ. එම ශක්තිය වික්‍රියා ශක්තිය ලෙස හැඳින්වේ.

වික්‍රියා ශක්තිය $= \frac{1}{2} \times$ ආතතිය $\times$ විතතිය

ආතතිය දන්නා විට, $e = \frac{FL}{Ay}$ භාවිතයෙන් ආතතිය සොයනු ලැබේ.විතතිය දන්නා විට, $F = \frac{yAe}{l}$ භාවිතයෙන් ආතතිය සොයනු ලැබේ. ඉන්පසු වික්‍රියා ශක්තිය **සොයාගනු ලැබේ.**

9. දිග 2m හා හරස්කඩ $10^{-6}$m$^2$ වන කම්බියක් තනා ඇත්තේ යංමාපාංකය $2 \times 10^{11}$ Nm$^{-2}$ වන ද්‍රව්‍යයකිනිග එය 0.1m ක් වන අතර හරස්කඩ වර්ගඵලය 1mm$^2$ වේ. එහි දිග 1mm කින් වැඩි කිරීම සඳහා අවශ්‍ය වන කාර්යය වනුයේ,

(1) $5\times10^{-1}$ J (2) $5\times10^{-2}$ J (3) $5\times10^{-3}$J (4)$5\times10^{-4}$ J (5) $5\times10^{-5}$ J

10. ස්වභාවික දිග $L$ වූ රබර් නලයක එක් කෙලවරකට $W$ බරක් සම්බන්ධ කර ඇති අතර එහි අනෙක් කෙලවර සීලිමට සම්බන්ධකර ඇතග නලයේ අභ්‍යන්තර අරය හා බාහිර අරය පිළිවෙලින් $r_1$ සහ $r_2$ වන අතර රබර් වල යංමාපාංකය $Y$ වේග $r_1$ සහ $r_2$ වෙනස් නොවේ යැයි සැලකූ විට නලයේ ගබඩා වී ඇති ශක්තිය,

(1) $\frac{W^2L}{2\pi Y(r_2^2 - r_1^2)}$ (2) $\frac{2W^2L}{2\pi Y(r_2^2 - r_1^2)}$ (3) $\frac{W^2L}{2\pi Y(r_1^2 - r_2^2)}$ (4) $\frac{WL}{2\pi Y(r_2^2 - r_1^2)}$ (5) $\frac{WL}{2\pi Y(r_1^2 - r_2^2)}$

## රේඛීය ප්‍රසාරණය සහ ප්‍රත්‍යස්ථතාවය සම්බන්ධ ගැටලු විසඳීම.

- රේඛීය ප්‍රසාරනතාවය $\alpha$ දිග $l_0$ දන්ඩක උෂ්ණත්වය $\Delta\theta$ ප්‍රමානයකින් වැඩිකල විට දිග වැඩිවන ප්‍රමාණය $\Delta L = \alpha\, l_0 \Delta\theta$ වේ. එලෙස උෂ්ණත්වය නිසා වැඩි වන දිග නැවත බලයක් යෙදීමෙන් අඩු කරන්නේ නම් ඒ සඳහා යෙදිය යුතු බලය $F$ සොයනු ලබන්නේ $F = \frac{yAe}{l}$ භාවිතයෙනි. එහි දී අඩු වන දිග $e$ ලෙස සලකනු ලබන්නේ $\Delta L$ ය. මෙහි දී දන්ඩේ ආරම්භක දිග ලෙස සලකන්නේ $L + \Delta L$ ය.
- රේඛීය ප්‍රසාරනතාවය $\alpha$ දිග $l_0$ දන්ඩක උෂ්ණත්වය $\Delta\theta$ ප්‍රමානයකින් අඩු කල විට දිග අඩු වන ප්‍රමාණය $\Delta L = \alpha\, l_0 \Delta\theta$ වේ. එලෙස උෂ්ණත්වය නිසා අඩු වන දිග නැවත බලයක් යෙදීමෙන් වැඩි කරන්නේ නම් ඒ සඳහා යෙදිය යුතු බලය $F$ සොයනු ලබන්නේ $F = \frac{yAe}{l}$ භාවිතයෙනි. එහි දී වැඩි වන දිග $e$ ලෙස සලකනු ලබන්නේ $\Delta L$ ය. මෙහි දී දන්ඩේ ආරම්භක දිග ලෙස සලකන්නේ $L - \Delta L$ ය.

- මෙලෙසම ශ්‍රේණිගත සංයුක්ත දන්ඩක් අචල ආධාරක අතර රඳවා උෂ්ණත්වය වැඩි කිරීමේ දී ඇතිවන එක් එක් දන්ඩට ඇතිවන ආතතිය සෙවීමේ දී $\Delta L = \alpha\, l_0 \Delta\theta$ භාවිතයෙන් එක් එක් දන්ඩෙන් වැඩි වන දිග වල් $\Delta L_1$ සහ $\Delta L_2$ සොයා වැඩි විය යුතු මුල දිග සොයා ගනු ලැබේ. එම දිග $\Delta L_1 + \Delta L_2$ වේ. එම දිග අඩු කිරීමේ දී ආධාරක දෙක මගින් ඇති කරන බලයයන් $F$ බැගින් ද එම බලය නිසා එක් එක් දන්ඩෙන් අඩුවන දිග වල් $e_1$සහ $e_2$ නම් $\Delta L_1 + \Delta L_2 = e_1 + e_2$ වේ.

11. හුක්ගේ නියමය ලියා දක්වන්න. ඇදි කම්බියක ගබඩා වී ඇති ශක්තිය $1/2$ ආතතිය $\times$ විතතිය බව පෙන්වන්න. $2m$ ක් දිග සහ විෂ්කම්භය $1.6mm$ වූ වානේ කම්බියක් $30℃$ දී දෙකෙළවර $2m$ ක් දුරින් වූ දෘඪ ආධාර දෙකකට සවිකර ඇත. ඉන්පසු කම්බියේ උෂ්ණත්වය $0℃$ දක්වා අඩුකරන ලදී. ප්‍රත්‍යස්ථ සීමාව ඉක්ම නොවූයේ නම් දී ඇති කම්බියේ ආතතිය කුමක්ද?

වානේ වල යංමාපාංකය $2.0 \times 10^{11} Nm^{-2}$

වානේ හි රේඛීය ප්‍රසාරණතාවය $1.1 \times 10^{-5} k^{-1}$

12. රූපයේ පෙන්වා ඇති පරිදි හරස්කඩ වර්ගඵලය $A$ වන වානේ ‍ංයං මාපාංකය $= E$ රේඛීය ප්‍රසාරණතාව $= \alpha$ දණ්ඩක් කොන්ක්‍රීට් ආධාරක දෙකක් අතර කලම්පකොට ඇත. දණ්ඩේ උෂ්ණත්වය $\Delta T$ වලින් ඉහළ නැංවුන විට දණ්ඩ ප්‍රසාරණය නොවී පවත්වා ගැනීමට විට කොන්ක්‍රීට් ආධාරක මගින් දණ්ඩේ එක් එක් කෙළවරට යෙදිය යුතු බලය ලබා දෙන්නේ,



(1) $AE\alpha\Delta T$ මගිනි.

(2) $AE / \alpha\Delta T$ මගිනි.

(3) $AE\alpha / \Delta T$ මගිනි.

(4) $AE\Delta T / \alpha$ මගිනි.

(5) $E\alpha\Delta T$ මගිනි.